DOI: 10.31357/fhssmst.2009.00034

# පුවත්පත් විශේෂ විධිවිධාන පනත හා එහි ක්‍රියාකාරිත්වය

**(1960 - 1973)**

අශෝකා ප්‍රියදර්ශනී හෙට්ටිආරච්චි

( MA/ MC/ 0004)

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සදහා ජනසන්නිවේදනය විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධනයයි.

**GS/HU/1613/2002**

## අපේක්ෂකයාගේ ප්‍රකාශය

මේ ශාස්ත්‍රීය නිබන්ධය ........................................ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියත් හෝ ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

දිනය 2009.11.30

අත්සන

27 NOV 2009

## උපදේශකයාගේ/උපදේශකයන්ගේ ප්‍රකාශය

මෙම අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි/කරමු.

දිනය අත්සන/අත්සන්

# පටුන


| | |
|---|---|
| අපේක්ෂකයාගේ ප්‍රකාශය | II |
| උපදේශකවරයාගේ ප්‍රකාශය | III |
| පටුන | IV |
| ස්තුතිය | V |
| **පළමු පරිච්ඡේදය** | **1 - 3** |
| හැඳින්වීම | 1 |
| සාහිත්‍ය විමර්ශනය | 2 |
| පර්යේෂණ ගැටලුව හා උපන්‍යාසය | 2 |
| ක්‍රමවේදය | 3 |
| අධ්‍යයනයේ සීමා හා ගැටලු | 3 |
| පරිච්ඡේද විකාශය | 3 |
| **දෙවන පරිච්ඡේදය** | **4 - 36** |
| ශ්‍රී ලංකාවේ පුවත්පත් හා ලේක්හවුස් ආයතනය | 4 |
| 2.1 ශ්‍රී ලංකාවෙ පුවත්පත් ආරම්භය | 4 |
| 2.2 ඩී. ආර්. විජේවර්ධන සහ ලේක්හවුස් ආයතනය | 10 |
| 2.3 1956 මහ මැතිවරණය හා ලේක්හවුස් ආයතනය | 18 |
| 2.4 1964 පුවත්පත් කොමිසම හා එහි පසුබිම | 20 |
| 2.5 1965 මහ මැතිවරණය | 33 |
| 2.6 1970 මහ මැතිවරණය | 34 |
| **තෙවන පරිච්ඡේදය** | **37 - 45** |
| ඇසෝසියේටඩ් නිවුස් පේපර්ස් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත, එහි අන්තර්ගතය හා ක්‍රියාකාරීත්වය | |
| **සිවුවන පරිච්ඡේදය** | **46 - 59** |
| ලේක්හවුස් අයිතිය වෙනස්වීම හා පසුකාලීන ගැටලු | |
| **පස්වන පරිච්ඡේදය** | **60 - 65** |
| සමාලෝචනය හා නිගමනය | |
| **මූලාශ්‍ර** | **66 - 69** |
| **උපග්‍රන්ථය** | **70** |
| 1. ඇසෝසියේටඩ් නිවුස් පේපර්ස් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත | |
| 2. ලේක්හවුස් පුවත්පත් අලෙවි වාර්තා | |

# ස්තුතිය

ජනසන්නිවේදනය ශාස්ත්‍රපති උපාධි නිබන්ධනය සඳහා කිසියම් විශේෂිත විෂය ක්ෂේත්‍රයක් තෝරාගත යුතු බව වටහා ගත් මොහොතේ සිට ම ඊට ගැළපෙන විවිධ මාතෘකා පිළිබඳ තොරතුරු විමසා බැලීමි. ඒ ඔස්සේ තෝරාගත් මාතෘකාව වූයේ මෙරට පුවත්පත් මහගෙදර ලෙස සැලකෙන ලේක්හවුස් ආයතනයේ නීතිමය පසුබිම පිළිබඳ විවරණයක යෙදීමයි.

නීතිය පිළිබඳ කිසියම් උනන්දුවක් විශ්වවිද්‍යාල ප්‍රවේශයට පෙර සිට ම පැවති බැවින් අධ්‍යයනයේ වෙහෙස බොහෝ සෙයින් දුරු වූ බව කිව යුතු ම ය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ පැවති දේශනවලදීත්, නිබන්ධනයට කරුණු විමසීමේ දීත් මග පෙන්වූ මහාචාර්ය තිස්ස කාරියවසම්, මහාචාර්ය ධම්මික ගංගානාත් දිසානායක සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සේනානි හරිශ්චන්ද්‍රයන් මෙහි දී ගෞරවයෙන් සිහිපත් කළ යුතු ය.

පාඨමාලාවේ සොයුරු කැල අධ්‍යයනයේ දී සහාය වූ අතර සියල්ල සම්බන්ධීකරණය වූයේ මහේෂ්ගේ මූලිකත්වයෙනි. නිලක්ෂි මහත් කැපවීමෙන් යුතු ව පරිගණක කටයුතු සිදුකර දුන්නී ය. අධ්‍යයනය අවසන් වන මේ මොහොතේ සැමගේ සහායට ස්තුතිය ප්‍රකාශ කර සිටින්නෙමි.

# පළමුවන පරිච්ඡේදය

## හැඳින්වීම

රටක පුවත්පත් ආරම්භය හා ඒවා මහජනයා අතර ප්‍රචලිතව පැවතීම එම රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සාධකයක් සේ සැලකේ. ශ්‍රී ලංකාව ද අයත් වනුයේ එකී ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායන් සහිත දේශපාලන ක්‍රමයන් මෙන්ම පුවත්පත් සම්ප්‍රදායන් ද පවතින රටක් ලෙසිනි. බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ සිට එනම් 19 වන සියවස මුල් භාගයේ සිට ඇරඹි මෙරට පුවත්පත් කලා භාවිතය, යුරෝපීය ලක්ෂණ සහිතව හැදී වැඩුණකි. පුවත්පත්වල ආකෘතිය, අන්තර්ගතය මෙන්ම සෙසු සියලු අංගෝපාංග ද යුරෝපීය පුවත්පත් කලාවට අනුරූපීව ගොඩනැගී තිබුණි.

බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ සිටම නිදහස් පුවත්පත් සම්ප්‍රදායකට අවශ්‍ය ඉඩකඩ සැපයීමට පාලක කණ්ඩායම් උත්සාහ දරා තිබේ. සෘජු රාජ්‍ය පාලනයේ පවතින පුවත්පත් වෙනුවට පාලනයට සම්බන්ධ පුවත්පත් හා නිදහස් පුවත්පත් ආරම්භ කර පවත්වාගෙන යාමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සකසා තිබේ.

මෙම පුවත්පත් සම්ප්‍රදාය නිදහස් පුවත්පත් සම්ප්‍රදායක් වුවද එහි සීමාව පිළිබඳ සමාජ කථිකාවන් ගොඩනැගී නොතිබීම යටත්විජිත පාලන කාලය තුළදීම දක්නට ලැබුණු දුර්වලතාවකි. පුවත්පත් තම අරමුණු මත රිසි සේ ක්‍රියාත්මක වීම මත, එය සෙසු අයගේ නිදහස හා අයිතීන්ට හානි කරන උපකරණයක් ලෙස ද ක්‍රියාත්මක වුණි. විශේෂයෙන් 1931 දී මෙරට සර්වජන ඡන්ද බලය හඳුන්වාදීමෙන් පසු පුවත්පත්වල අන්තර්ගතය වෙනස්වීමකට ලක්වූ බව පෙන්වා දිය හැකිය.

එබැවින් මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ පුවත්පත් සමාගමක් රජය සතු කර ගැනීම පිළිබඳව පැවැති තත්ත්වය ජනමාධ්‍ය ප්‍රතිපත්තිමය දෘෂ්ටිකෝණයෙන් විමර්ශනය කිරීමයි.

ඕනෑම රටක ජනමාධ්‍ය සඳහා රජය අනුගමනය කරනු ලබන විවිධ ක්‍රමවේදයන් එනම් නීති, අණපනත් හා මාර්ගෝපදේශ එම රටේ ජනමාධ්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන කොටස් ලෙස පිළිගැනේ. එම අර්ථයෙන් ලේක් හවුස් ආයතනය රජය සතු කර ගැනීම එකී තත්ත්වයට අදාළ අවස්ථාවකි.

රජය සතුව පුවත්පතක් නොතිබුණු අවධියක ප්‍රධාන පුවත්පත් ආයතනයක් රජය සතු කර ගැනීම විශේෂිත තත්ත්වයකි. මෙය හදිසි තීරණයක් නොව කාලයක් පුරා පැවති සංවාදයක ප්‍රතිඵලයකි.

1973 අංක 28 දරන ඇසෝසියේටඩ් නිවුස්පේපර්ස් ඔෆ් සිලෝන් (විශේෂ විධි විධාන) පනත 1973 ජූලි මස 20 වන දින සිට ක්‍රියාත්මක වුණි. 1974 අංක 23 සහ 1981 අංක 35 දරන පනත් මඟින් නැවත සංශෝධනය කෙරිනි.

පනතේ හැඳින්වීම් වාක්‍යය දෙස බැලුවහොත් අරමුණ ලේක් හවුස් ආයතනය රජයට පවරා ගැනීම නොවේ. එහි අයිතිය පුළුල් කිරීමයි.

## සාහිත්‍ය විමර්ශනය

ලේක්හවුස් ආයතනය පිළිබඳ කරණු අධ්‍යයනයේ දී මෙරට ජනමාධ්‍ය ප්‍රතිපත්තියේ තීරණාත්මක අවස්ථාවක් ලෙස සැලකෙන 1964 පුවත්පත් කොමිෂන් සභා වාර්තාව වැදගත් තැනක් ගනී. මෙරට සමස්ත පුවත්පත් කලා භාවිතයන්, ලේක්හවුස් ආයතනයට විශේෂිතව පුවත්පත්වල හැසිරීමත් එමඟින් විමර්ශනය කර තිබුණි. ඊට සම්බන්ධව එහි අතුරු වාර්තාව සහ විනිමය කටයුතු පිළිබඳ කොමිෂන් සභා වාර්තාව ද වැදගත් තැනක් ගන්නා බව පෙන්වා දිය හැකිය.

ලේක්හවුස් ආයතනයේ නිර්මාතෘ ඩී. ආර්. විජේවර්ධනගේ චරිතාපදානය ද වැදගත් තොරතුරු සපයයි. එම්. ඒ. ජේ. හුළුගල්ලගේ තොරතුරු මෙන්ම විවරණයන් ද දෑවැන්ත පුවත්පත් සංවිධානයක් ගොඩනැගීමේ පසුබිම් සාධන හෙළිකරයි.

ලේක්හවුස් ආයතනය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී වැදගත් වන මූලාශ්‍රමය තත්ත්වයක් වන්නේ කාලාන්තරයක් පුරා එහි සේවය කළ පුවත්පත් කලාවේදීන් හා පාලකයින් රචනා කර ඇති චරිතාපදන හා වෙනත් අත්දැකීම් ය. සෑම කතුවරයෙක්ම පාහේ තම ජීවිත අත්දැකීම් සංග්‍රහිත කර තිබුණි. මාර්ටින් වික්‍රමසිංහ, එම්. ඒ. ජේ. හුළුගල්ල, වෙ. වි. අබේගුණවර්ධන, ඩී. එෆ්. කාරියකරවන, ධර්මසිරි ජයකොඩි යනාදීන් ඉන් කීප දෙනෙකි.

## පර්යේෂණ ගැටලුව හා උපන්‍යාසය

පුවත්පත් ආයතනයක් රජය සතු කර ගැනීම ප්‍රජාතාන්ත්‍රික මූල ධර්මයන්ට අනුරූපව සලකා බලන කල ගැටලු සහගත වුවද එම ආයතනයේ ප්‍රකාශන මඟින් සකස් කළ පසුබිම එවැනි තත්ත්වයන් නිර්මාණය කිරීමට හේතු විය.

පෞද්ගලික ව්‍යවසායකත්වයේ සිට රාජ්‍ය ව්‍යවසායකත්වයට මාරුවීමක් ලෙස මෙය නම් කළ නොහැකිය. එබැවින් මෙම අධ්‍යයනයේදී උපන්‍යාසය ලෙස භාවිත කරනු ලබන්නේ පුවත්පත් විශේෂ විධි විධාන පනත එහි ක්‍රියාකාරීත්වය තුළ පනතින් ප්‍රකාශිත අපේක්ෂිත අරමුණු ඉටු කර නොමැති බවයි.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ එක් ක්‍රමවේදයක් ලෙස ලේක් හවුස් ආයතනය ආරම්භයේ සිට ඊට අදාළ ප්‍රධාන අවස්ථා, සිද්ධි අධ්‍යයන (Case Study) ක්‍රමවේදය යටතේ විමර්ශනය කෙරේ.

සංයුක්ත ක්‍රමවේදයක් ලෙස කොමිෂන් සභා වාර්තා, අණපනත්, හැන්සාඩ්, චරිතාපදාන, සමාගම් වාර්තා, පුවත්පත් ආදිය ද්විතීයික මූලාශ්‍ර ලෙස යොදා ගැනේ.

## අධ්‍යයනයේ සීමා හා ගැටලු

මූලික වශයෙන් ඇසෝෂියේටඩ් නිව්ස් පේපර්ස් ඔෆ් සිලෝන් (විශේෂ විධිවිධාන) පනත පිළිබඳ නීතිමය විවරණයෙන් සීමිත වීම අධ්‍යයනයේ දී ගැටලුවක් ලෙස මතුවිය. දෙවනුව පනත සඳහා පසුබිම සකස් කළ පිරිස් අතරින් බහුතරයක් ජීවතුන් අතර නොසිටීමත්, ඔවුනගේ චරිතාපදාන හා සටන්වල මීට අදාළ කොටස් සාකච්ඡා කිරීමෙන් වැළකී සිටීමත් හඳුනාගත හැකි ලක්ෂණයකි. එබැවින් ඇතැම් ප්‍රාථමික මූලාශ්‍ර අධ්‍යයනයට ලක්කිරීමට නොහැකි වීම සීමාවක් වූ බව දැක්විය හැකිය.

## පරිච්ඡේද විකාශය

මෙම නිබන්ධයේ පළමු පරිච්ඡේදය තුළින් අධ්‍යයනයේ පසුබිම, ක්‍රමවේදය හා සීමාවන් හඳුන්වා දුනි.

දෙවන පරිච්ඡේදයේ දී මෙරට පුවත්පත් ආරම්භය කෙටියෙන් හඳුන්වා ලේක්හවුස් ආයතනය රජයට පවරා ගැනීමේ පනත ඉදිරිපත් කරන තෙක් ඊට පසුබිම් වූ සාධක සාකච්ඡාවට ලක් කළෙමි.

තුන්වන පරිච්ඡේදය වෙන්වූයේ ඇසෝෂියේටඩ් නිව්ස් පේපර්ස් ඔෆ් සිලෝන් (විශේෂ විධිවිධාන) පනතේ අන්තර්ගතය හා ඊට අදාළ පාර්ලිමේන්තු විවාදයේ විශේෂ අවස්ථා ගෙනහැර දැක්වීමයි.

පනතින් පසු ලේක්හවුස් ආයතනයේ ක්‍රියාකාරීත්වය හා ඊට අදාළව ඉදිරිපත් වූ ප්‍රතිපත්තිමය කරුණු සිව්වන පරිච්ඡේදයේ දී පෙන්වා දුනිමි.

ඒ ඔස්සේ පස්වන පරිච්ඡේදය මඟින් සමාලෝචනය හා නිගමනයන් ඉදිරිපත් කළෙමි.

උපග්‍රන්ථයට එක්කළේ ලේක්හවුස් පුවත්පත්වල අලෙවියට අදාළ වාර්තාවක් සහ පනතේ සම්පූර්ණ පිටපතයි.

# දෙවන පරිච්ඡේදය

## ශ්‍රී ලංකාවේ පුවත්පත් හා ලේඛ්හවුස් ආයතනය

### 2.1 ශ්‍රී ලංකාවේ පුවත්පත් ආරම්භය

ලංකාවේ පුවත්පතක හැඩය ගත් පළමු ප්‍රකාශනය වන්නේ Ceylon Government Gazette (1802) ප්‍රකාශනය යි. අයිතිය හා පාලනය යටතේ රජයේ මුද්‍රණාලයෙන් මෙය නිකුත් කෙරිණි. යටත් විජිත පාලකයන්ගේ නිල මතය මෙමගින් පිළිබිඹු කෙරිණි. පොදු නිවේදන, රජයේ දැන්වීම්, අධිකරණ නිවේදනය ඇතුළු පොදු මහජනයාගේ දැනුවත් වීමට අදළ තොරතුරු ඊට ඇතුළත් විය. මහජන දැන්වීම්වලට ද මෙහි ඉඩකඩ සැපයිණි. පෞද්ගලික දැන්වීම්, භාණ්ඩ අලෙවිය, නැති වූ භාණ්ඩ පිළිබඳ නිවේදන, නැව් පැමිණීම හා පිටත්වීම, උපත්, විවාහ හා මරණ යනාදී නිවේදන වලට ද ඉඩකඩ සැපයිණි. සැම සඳුද දිනකම මධ්‍යාහ්න 12.00ට පෙර බෙදහැරීමට සූදනම් කරන බව එහි මුල්ම ප්‍රකාශනයේ නිවේදනය කර තිබුණි. 1832 වන තෙක් මෙරට පැවති එක ම පුවත්පත ලෙස මෙය හඳුන්වයි (de Silva: 1972, 14).

1832 දී Colombo Journal පුවත්පත ප්‍රකාශයට පත්වනුයේ එවකට ආණ්ඩුකාර විල්මට් හෝර්ටන්ගේ මැදිහත්වීමෙනි. ඔහුගේ දායකත්වය යටතේ යටත් විජිත පාලනයේ නිලධාරීහු ඊට සහාය වූහ. පුවත්පතේ මුද්‍රණ කටයුතු සිදුකරන ලද්දේ රජයේ මුද්‍රණාලය මගිනි. එහි ප්‍රධානී ජෝර්ජ් ලී සංස්කාරක ලෙස කටයුතු කළ බව පෙනී යයි. හෝර්ටන්ගේ මතයට වඩා වෙනස් මතයක් පුවත්පත තුළින් නිරූපණය වූ බවත්, බ්‍රිතාන්‍ය පාලනය පවා ඉන් විවේචනය වූ බවත් දක්නට ලැබේ (විජේතුංග: 2003, 47). යටත් විජිත පාලකයන් පුවත්පත නවතා දැමීමට හේතු වූයේ එම තත්ත්වය බව ජනප්‍රිය මතය යි.

කෙසේ වුව ද විල්මට් හෝර්ටන් ආණ්ඩුකාරවරයා මෙරටට පැමිණෙන්නේ පුවත්පතක අවශ්‍යතාව මතුකරලමිනි (1831 ඔක්තෝබර්). එම නිසා ආණ්ඩුවේ ගැසට් පත්‍රයට වඩා වෙනස් මුහුණුවරකින් යුරෝපයේ පුවත්පතක මුහුණුවරින් යුත් පුවත්පතක් ආරම්භ කිරීමට ඔහු මුල් විය. Colombo Journal පුවත්පත රජයට අයත් පුවත්පතකි. එහි පසුබිමේ හිමිකාරයා වූයේ ආණ්ඩුකාරවරයා ය. මුද්‍රණය කරනු ලබන්නේ රජයේ මුද්‍රණාලයේ ය. සංස්කාරකවරයා රජයේ මුද්‍රණාලයාධිපතිවරයා ය. ඊටත් අමතර ව එහි සහාය සංස්කාරක වූයේ ආණ්ඩුකාරවරයාගේ පුද්ගලික ලේකම් තනතුර හෙබ වූ ඥාතීත්වයෙන් ඔහුගේ බෑණා වන හෙන්රි ටෆ්නෙල් ය (Hulugalle: 1960, 85).

1832 ජනවාරි 07 වන දින නිකුත් වූ පළමු කලාපයේ කතුවැකියෙන් පෙන්වා දෙන්නේ එය ගැසට් පත්‍රයට අමතර ව අලුත් පුවත්පතක් බවයි. රජයේ නිල ප්‍රකාශනය

නොවූවත් එයට එරෙහි ව කටයුතු නොකරන බව ද එමගින් පෙන්වා දී තිබේ (de Silva: 1972, 17-18).

මේ තත්ත්වය වඩාත් පැහැදිලි වන්නේ 1833 දී පුවත්පත නවතා දමන ලෙස නියෝග කරමින් බ්‍රිතාන්‍ය පාලනය දන්වා සිටියේ ලංකාවේ පුවත්පත් පළ කිරීමේ කාර්යය පුද්ගලික අංශයට පැවරිය යුතු බවයි. රජය යටතේ පුවත්පතක් ආරම්භ කිරීම වෙනුවට ඒ වන විටත් රජයේ ප්‍රකාශයක් ව පැවති Ceylon Government Gazette දියුණු කිරීමට සියලුම ශක්තිය යොදවන ලෙස ඔවුහු වැඩි දුරටත් දන්වා සිටියහ (Wright: 1907, 301).

මේ අනුව ලංකාවේ දෙවැනි පුවත්පත හා පළමු පුද්ගලික අංශයේ පුවත්පත ලෙස The Observer and Commercial Advertiser (1834) නිකුත් විය. පී. ඇක්ලන්ඩ් සහ ඊ. ජේ. ඩාර්ලි නම් යුරෝපීය ව්‍යාපාරිකයන් දෙදෙනා අයිතිකරුවන් වූහ. ඊ. ජේ. ඩාර්ලි ආරම්භයේ දී එහි කර්තෘ ලෙස ද කටයුතු කළ බව පෙනේ. ඔහු මෙරට සුප්‍රකට යුරෝපීය සමාගමක් වූ Darley Butler and Company හි අයිතිකරු වූ අතර පුවත්පත වෙළඳමට සම්බන්ධ කර පවත්වාගෙන යනු ලැබිණි. ඒ අනුව කතුවරයා හා අයිතිකරු එක ම පුද්ගලයා වීම ලංකාවේ සමාජයට මුල්වරට අත්දැකිය හැකිවිය. එහෙත් පුවත්පත් අයිතිය කෙටිකාලයක් ඇතුළත වෛද්‍ය ක්‍රිස්ටෝපර් එලියට් සතු විය (Wright: 1907, 301). අයිතිකරු හා කර්තෘ එක ම පුද්ගලයකු වීම හේතු කොටගෙන පුවත්පතේ අන්තර්ගතය වඩා නිදහස් ව හා අවම වාරණයක් යටතේ ක්‍රියාත්මක වීම වඩා හොඳින් අත්දැකිනු ලැබූ අවස්ථාවක් ලෙස Observer පුවත්පතේ ක්‍රිස්ටෝපර් එලියට් යුගය දැක්විය හැකි ය. ඉංග්‍රීසි පාලකයන් විවේචනය කිරීම, ස්වදේශිකයන්ට වැඩි බලතල ලබා දෙන පාලන ව්‍යුහයක් ඇති කිරීම ඔහුගේ ප්‍රධාන සටන් පාඨ විය. 1848 කැරැල්ල සමයේ මේ තත්ත්වය තව දුරටත් කැපී පෙනුණි.

1859 දී පුවත්පතේ අයිතිය 1846 සිට එහි උපකතුවරයකු ව සිටි ඒ. එම්. ෆර්ගියුසන් විසින් (පවුම් 120 කට) හිමිකර ගනී. ෆර්ගියුසන් ද ඉංග්‍රීසි පාලනයට සම්බන්ධ වූවෙක් වුවත් එහි බලපෑමට නතු වූ බවක් නොපෙනේ. මොහු ලංකාවට පැමිණියේ මැකෙන්සි ආණ්ඩුකාරවරයාගේ පුද්ගලික ලේකම් වශයෙනි. ෆර්ගියුසන් කර්තෘත්වය හා අයිතිය ලංකාවේ පුවත්පත්වල පවුලේ අයිතිය පිළිබඳ සාධකයේ ආරම්භය ලෙස දැක්විය හැකි ය. ඔහුගේ ඥාති පුත් ජෝන් ෆර්ගියුසන් පුවත්පතේ සහකාර කර්තෘ ලෙස 1861 දී බඳවා ගනී (Hulugalle: 1960, 88). 1870 දී ඔහු සමකර්තෘ ලෙස කටයුතු කළ අතර 1875 දී පුවත්පත ව්‍යාපාරික සමාගමක් බවට පත්කරන විට එහි ප්‍රධාන කොටස්කරුවෙක් විය. (ඒ. එම්. සහ ජෝන් ෆර්ගියුසන්) (Wright: 1907, 303). පවුලේ අයිතියට අමතර ව පුවත්පත රාජ්‍ය පාලනය හා සම්බන්ධ වීමේ එසේ නැතහොත් පාලනයේ කොටස්කරුවෙකු බවට පුවත්පත් හිමිකරුවන් පත්වීම ද ෆර්ගියුසන් පවුල ඇසුරින් වටහාගත හැකි ය. ඒ 1092 දී ලංකා ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයකු ලෙස ජෝන් ෆර්ගියුසන් පත්වීමයි. ඔහුගේ පුත් ආර්. එච්. ෆර්ගියුසන් පසුව එහි කර්තෘ ලෙස පත්වූ අතර පුවත්පත ක්‍රමයෙන් අසාර්ථක විය. පසුව යුරෝපීය වෙළඳ හවුලක් මගින් එහි අයිතිය

යටත් විජිත පාලනයේ හිමිකාරිත්වය යටතේ පැවති Colombo Journal පුවත්පත නවතා දැමීමෙන් පසුවත් ආණ්ඩුකාරවරයාගේ අරමුණ වූයේ පෞද්ගලික මට්ටමින් පුවත්පතක් ඇරඹීමට ය. ඒ අනුව 1837 දී Colombo Chronicle පුවත්පත ඇරඹිණි. Observer පුවත්පතින් ආණ්ඩුකාරවරයා විවේචනය කළ බැවින් ඊට පිළිතුරු සැපයීමේ පුවත්පතක් බවට Chronicle පත්වූ බව පෙනේ (Hulugalle: 1960, 86).

පුවත්පත් අතර ඇරඹි සටන, හිමිකාරීත්වයේ සටනක් ලෙස ද නම් කළ හැකි ය. මේ යුගයේ පුවත්පත් ආරම්භ වනුයේ හිමිකරුවාගේ අදහස්, විවේචන ඉදිරිපත් කිරීම අරමුණු කර ගනිමිනි.

> "... the marchants of Colombo started The Observer and Commercial Advertiser, which made its apearance on February 4th, 1834. With the new paper attacking the Governor it was felt in some quarters that should be as organ of public opinion which could defend the administration. On May 3rd, 1837. The Ceylon Chronicle made its first appearence. The Govenor and members of the public service contributed articles under various pen-names" (Hulugalle: 1963, 55).

පුවත්පතේ කර්තෘ වූයේ සැමුවෙල් ඕවන් ග්ලෙනි පියතුමා ය. පුවත්පතක් ලෙස යටත් විජිත පාලනයට එරෙහි පුවත් මෙහි පළ නොකළ අතර ඉතා කෙටිකලකින් (1838) මෙය බිඳවැටීමට හේතු වූයේ ද එකී ඒකපාර්ශ්වීය අන්තර්ගතය හේතුවෙනි (විජේතුංගඃ 2003, 52).

ක්‍රොනිකල් පුවත්පතේ ආරම්භය වැදගත් වන්නේ පසුකාලීනව ලංකාවේ ආරම්භ කෙරුණ Times පුවත්පත් ආයතනයට අදාළ මුද්‍රණ යන්ත්‍ර හා අක්ෂර හිමිකරුවන්ගේ වෙනස්වීම් හරහා ඊට ලැබෙන බැවිනි. පුවත්පත්වල අයිතිය යනු අක්ෂර හා මුද්‍රණ යන්ත්‍ර අත්පත් කරගැනීම මගින් තමන්ට අවශ්‍ය මතයක් පළකිරීම බව සනාථ කිරීමට මෙම උදාහරණය ප්‍රමාණවත් වේ.

ක්‍රොනිකල් පුවත්පත බිඳවැටීමත් සමග එහි යන්ත්‍රසූත්‍ර මිල දී ගන්නා රෝස් නමැති බ්‍රිතාන්‍ය ජාතිකයා Ceylon Herald නම් පුවත්පත (1838 දී) ආරම්භ කරනු ලැබීය. මෙහි අන්තර්ගතය ක්‍රොනිකල් පුවත්පතට වඩා වෙනස් වූ අතර ආණ්ඩුකාරවරයාගේ ක්‍රියාකලාපය පවා විවේචනය විය. 1842 දී ජේම්ස් ලැංග් නම් පුද්ගලයා එහි අයිතිය මිල දී ගත් පසු පුවත්පතේ පක්ෂපාතිත්වය වෙනස් විය. එය පූර්ණ වශයෙන් යටත් විජිත පාලනයට එකඟ විය. 1845 දී නෙල්ටන් නමැත්තා එහි අයිතිය මිල දී ගෙන කතුවරයා බවට පත්විය. 1846 දී ඉංග්‍රීසි ව්‍යාපාරිකයන් පිරිසක් (පවුම් 450) පුවත්පත මිල දී ගනු ලැබීය. ඔවුන්ට අවශ්‍ය වූයේ Observer පුවත්පතට එරෙහි ව පුවත්පතක් ආරම්භ කිරීම යි. ඒ අනුව Ceylon Times (1846)

පුවත්පත ආරම්භ කෙරිණි. පුවත්පතේ හිමිකරුවන් වූයේ Wilson සහ Ritchie and Company යන පිරිස යි. ඔවුහු ගල්කිස්සේ සහ වෙනත් ප්‍රදේශවල පොල්තෙල් කර්මාන්ත ශාලා පවත්වාගෙන ගිය අතර විවිධ ව්‍යාපාරවල නියැලුණහ (Wright: 1907, 304). මෙම ව්‍යාපාරික මැදිහත් වීමත් සමග විවිධ පුද්ගලයන් යොදා ගනිමින් වක්‍ර ව පුවත්පත් පළ කිරීමට යටත් විජිත පාලකයන් දැරූ උත්සාහයන් අවසන් වූ බව පෙන්වා දිය හැකි ය.

Times ආයතනයේ අයිතිය 1858 දී ජෝන් කැපර් විසින් මිල දී ගනු ලබයි. ඒ වන විට ව්‍යවස්ථාදායක සභාවේ යුරෝපීය වෙළඳුන් සඳහා වන නිල නොලත් මන්ත්‍රී ධූරය දරන ලද්දේ ද ඔහු විසිනි. යටත් විජිත පාලනයේ අනුග්‍රහය Times ආයතනයට ලැබීමට එය හේතුවක් විය. ඔහු 1864 දී එම තනතුරින් ඉවත් ව කොමිෂන් සභාවක තනතුරකට පත්විය. ඔහු පුවත්පතේ හිමිකාරීත්වය පවරන ලද්දේ ඥාති පුත්‍රයෙකු වූ කෙප්ලේ ජෝන්ස් ට ය. 1874 දී Times ආයතනය දේශීය බැංකුවක අනුග්‍රහය යටතේ සීමිත සමාගමක් බවට පත්විය. 1882 දී එම සමාගම බිඳවැටුණු අතර නැවත පුවත්පතේ අයිතිය කැපර් සතු විය. හර්බට් කැපර් සහ ෆ්‍රෑන්ක් කැපර් යන පුතුන් දෙදෙනා ඔහු පුවත්පත් ආයතනයට එක් කරගනු ලැබීය.

1905 දී හර්බට් කැපර්ගේ අභාවයෙන් පසු ෆ්‍රෑන්ක් කැපර් Times හි පූර්ණ හිමිකරුවා බවට පත්විය. වතු වගාවට මෙරටට පැමිණි ෆ්‍රෑන්ක්ට හපුතලේ සහ කෑගල්ල ප්‍රදේශවල වතුයායවල් ද හිමි ව තිබිණි. 1946 දී ඔහු මෙරට ව්‍යාපාරික භාරයකට (Trust) එය මිලියන හතකට අලෙවි කරනු ලබයි (Hulugalle: 1960, 88). මේ අනුව 1858 සිට 1946 දක්වා (1874 සිට 82 දක්වා කාලයේ සුළු වෙනස්කම් සහිත ව) Times ආයතනයේ පාලනය ජෝන් කැපර් යන ඔහුගේ පවුලේ සාමාජිකයන් සතු ව පැවතුණි.

බ්‍රිතාන්‍ය ජාතිකයන් සතු ව පැවතුණ ද ඇතැම් අවස්ථාවල දී Times පුවත්පත යටත් විජිත පාලනයේ ක්‍රියාදාමයන් විවේචනය කිරීමට ද මුල් විය. 1874 දී දේශීය පරිපාලන වියදම් සම්බන්ධයෙන් යටත් විජිත ලේකම් කාර්යාලය හා ආණ්ඩුකාරවරයා අතර ඇති වූ මතභේදයේ දී යටත් විජිත කාර්යාලය විවේචනය කිරීමට Times පුවත්පතේ වාර්තා පළවුණි (Senadhira: 1996, 13). 1876 පැවති පානදුරා වාදයේ දී බෞද්ධ - කතෝලික සටනින් බෞද්ධයන්ට ජය අත්වෙන බවට හැඟවෙන තොරතුරු පුවත්පතේ පළ වූ බව කියැවේ. පානදුරා වාදය පිළිබඳ පූර්ණ වාර්තාවක් පුවත්පතේ පළ කරනවාට අතිරේක ව එය පොත් පිංචක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට ද ජෝන් කැපර් මූලික විය (තිලකසිරි: 2000, 177).

1898 දී ආරම්භ වූ Ceylon Standard පුවත්පත ද හිමිකාරිත්වය සම්බන්ධ විවිධ වෙනස්කම්වලට ලක් වූ පුවත්පතකි. ආරම්භක අවස්ථාවේ හිමිකරුවන් පිළිබඳ පැහැදිලි තොරතුරු නොමැති නමුත් 1904 දී එහි අයිතිය ජේ. ජී. සී. මෙන්ඩිස්, ජේ. ඩබ්ලිව්. චාල්ස් ද සොයිසා, එෆ්. ජේ. මෙන්ඩිස් යන ව්‍යාපාරිකයන්ට හිමි විය. පසුව Standard පුවත්පත Morning Leader පුවත්පතේ හිමිකරුවන් ව සිටි සොයිසා පවුලට අයත් විය. සොයිසා

පවුලෙන් පසුව චාල්ස් පීරිස්, සී. ඊ. ඒ. ඩයස් හා ඩබ්ලිව්. ඒ. ද සිල්වාට අයත් විය. අවසානයේ සමස්ත අයිතිය ඩබ්ලිව්. ඒ. ද සිල්වාට හිමි විය (Hulugalle: 1960, 93). ආරම්භයේ දී Standard පුවත්පත යම්තාක් දුරට නිදහස් අදහස් හා මතවාදවලට ඉඩකඩ සපයා තිබුණි (Wright: 1907, 313). සොයිසා පවුලට අයත් වූ පසු එය උගත් ලාංකිකයා සඳහා ව්‍යවස්ථාදායකයේ පැවති අසුන දිනාගැනීමේ සටනේ දී තීරණාත්මක සාධකයක් බවට පත්විය. ඒ සඳහා ඉදිරිපත් ව සිටි වෛද්‍ය මාකස් ප්‍රනාන්දු සිය විවාහය මගින් සොයිසා පවුලට සම්බන්ධව සිටියේය. එම නිසා එම තරගයේ දී Ceylon Morning Leader පුවත්පත ඍජු ලෙස ම භාවිත කළ පෙනී යයි.

මේ අනුව ක්‍රම ක්‍රමයෙන් විවර වෙමින් පැවති ස්වදේශිකයන්ට පාලනයට සම්බන්ධ වීමේ හැකියාවට පුවත්පත් හිමිකාරීත්වය ද සාධකයක් විය. වෛද්‍ය මාකස් ප්‍රනාන්දුගේ ප්‍රතිවාදියා වූ පොන්නම්බලම් රාමනාදන් වෙනුවෙන් ද වෙනම ම පුවත්පතක් පළවීමෙන් මේ කාරණය තව දුරටත් සනාථ වේ. ඒ 1913 දී ඇරඹි Ceylonese පුවත්පත යි. උගත් ලාංකිකයා සඳහා වන තරගයට නාමයෝජනා ඉදිරිපත් වූ විට රාමනාදන් සහ ඔහුගේ හිතවතුන් වූ හෙක්ටර් ජයවර්ධන, කර්නල් ටී. ජී. ජයවර්ධන, වෛද්‍ය ඊ. ඩබ්ලිව්. රත්නම්, ප්‍රැන්සිස් ද සොයිසා යන කොටස්කරුවන්ගේ ප්‍රධානත්වයෙන් පුවත්පත ආරම්භ කෙරුණි (Hulugalle: 1960, 79). Ceylonese පුවත්පතට සම්බන්ධ සෑම කොටස්කරුවෙක් ම තම රාජකාරිය ලෙස සැලකුවේ කතුවරුන්ට අණ දීම යි. තමන්ට අවශ්‍ය ප්‍රවෘත්ති පළ කිරීමටත්, වළක්වාලීමටත් ඔවුහු මැදිහත් වූහ (Hulugalle: 1960, 80).

මේ ආකාරයට ව්‍යවස්ථාදායක සභාවේ නියෝජිත තනතුරු හා පුවත්පත් අයිතිය අතර පවත්නා සබඳතාව තවත් පුවත්පත් ගණනාවක් ඔස්සේ ද විමසා බැලිය හැකි ය.

1846 දී ඇරඹුණු Examiner පුවත්පත මුලින් ම අයත් වූයේ බ්‍රිතාන්‍ය ව්‍යාපාරික කණ්ඩායමකට ය. පසුව එය ආර්. ඊ. ලූවිස් මිල දී ගත්තේ ය. නීතිඥ ජෝන් සෙල්බි පසුව එය මිල දී ගත් අතර 1852 දී සී. ඒ. ලෝරන්ස් සහ ඔහුගේ නීතිඥ මිතුරන් විසින් මිල දී ගන්නා ලදි. ලෝරන්ස් 1859 දී ව්‍යවස්ථාදායක සභාවේ බර්ගර් ජාතික නියෝජිතයා වශයෙන් පත්කරන ලදි.

Ceylon Independent හි කතුවරයා වූයේ ජෝර්ජ් වෝල් ය. ඔහු ලංකා වැවිලිකරුවන්ගේ සංගමයේ ආරම්භකයා ය. ව්‍යවස්ථාදායකයේ වැවිලිකරුවන්ට වැඩි නියෝජනයක් ලබා දිය යුතු ය යන සටනේ ඔහු නිරත විය. පසුව Independent හි අයිතිය බර්ගර් ජාතිකයෙකු වූ හෙක්ටර් වැන්කියුලන්බර්ග්ට හිමිවිය. 1912 දී බර්ගර්වරුන්ට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ වෙන ම ඡන්දදායක කොට්ඨාසයක් ලැබුණු විට ඔහු ඊට තේරී පත්විය.

1841 දී යාපනේ දී පළ කළ උදය තාරකෙයි පුවත්පත (Morning Star) දෙමළ - ඉංග්‍රීසි ද්වීභාෂික පුවත්පතකි. මනිපායිහි පිහිටි ඇමෙරිකානු මිෂනාරී මුද්‍රණාලය මඟින් එය ප්‍රකාශනයට පත් කළේ "Jaffna Tract Society" මඟිනි.

සිංහල භාෂාවෙන් පුවත්පත් ආරම්භයට ද බලපෑවේ මුද්‍රණාලයක හිමිකාරිත්වය ලබා ගැනීමේ ගැටලුව යි. සියම් රජුගේ ආධාර ඇති ව නව මුද්‍රණ යන්ත්‍රයක් සපයා ගැනීමට බුලත්ගම ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමියෝ සමත් වූහ. එය මෙරට සිංහලයන්ට අයත් වූ පළමු මුද්‍රණ යන්ත්‍රය ලෙස සැලකේ (බුද්ධදත්තඃ 1950, 75). ඒ අනුව 1860 දී ලංකාලෝකය පුවත්පත එම මුද්‍රණ යන්ත්‍රය පිහිටවූ ලංකෝපකාර මුද්‍රණාලය මඟින් මුද්‍රණය කරන ලදි.

ලක්මිණි පහණ (1862) පළවූයේ කොග්ගල ධර්මරත්න පඬිතුමාගේ කර්තෘත්වයෙනි. එහි ප්‍රකාශක ලෙස සඳහන් වන්නේ හෙන්ද්‍රික් පෙරේරා ය.

1880 දී ආරම්භ වූ සරසවි සඳරැස පුවත්පතේ හිමිකාරිත්වය පැවතියේ පරම විඥානාර්ථ බෞද්ධ සමාගමට ය. ආරම්භක කතුවරයා වූයේ වේරගම පුංචිබණ්ඩාර ය. සඳරැස පුවත්පත පාලනය කළ සමාගම හා පසුව එහි කතුවරයා ව සිටි එච්. එස්. පෙරේරා අතර ඇති වූ ආරවුලකින් පසු කර්තෘ ධූරයෙන් ඉවත් කළ බවට තොරතුරු පවතී. හිමිකාරිත්වය හා සංස්කාරකවරු අතර ඇති වූ ආරවුල් හා ගැටුම් පිළිබඳ විමසීමේ දී මෙම සිදුවීම වැදගත් වේ.

සිංහල බෞද්ධයා (1906) දී ආරම්භ වනුයේ ලංකා මහාබෝධි සමාගම මඟිනි. පුවත්පත ආරම්භ කිරීමට පදනම සකස් කරනු ලැබුයේ අනගාරික ධර්මපාලතුමා විසිනි. කතුවරයා වූයේ පියදාස සිරිසේන ය.

1910 දී ආරම්භ කරනු ලබන 'දිනමිණ' පුවත්පතේ හිමිකාරිත්වය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී වැදගත් වේ. ඊට හේතුව වන්නේ එහි කර්තෘවරයා වූ එච්. එස්. පෙරේරා එහි හිමිකරුවා වීම යි. එක් අතකින් පුවත්පතේ සියලුම පාලන කටයුතු ඔහු යටතේ සිදු කිරීමට වූ හැකියාව මේ ඔස්සේ දැකගත හැකි ය. අනෙක් අතට පුවත්පත බිඳවැටීමට ද එම හිමිකාරිත්වය හා කතුවරයා එක් පුද්ගලයෙකු වීම හේතු වේ. ආර්ථික ගැටලු, විවිධ අසනීප ආදිය හේතුවෙන් බිඳවැටුණු දිනමිණ 1914 දී මිල දී ගනු ලබන්නේ ඩී. ආර්. විජේවර්ධන යි.

මේ ආකාරයට ලාංකීය පුවත්පත් කලාවේ මුල් සියවස අවසාන වන විට ප්‍රධාන ආයතන 03 ක පුවත්පත් වර්ගීකරණයක් හඳුනාගත හැකිය.

1. කර්තෘ මූලික පුවත්පත්
2. සංගම් මූලික පුවත්පත්
3. ව්‍යාපාරික මූලික පුවත්පත්

බොහෝ පුවත්පත් කර්තෘ මූලික හා සංගම් මූලික වූ අතර ඒවායින් කර්තෘ මූලික පුවත්පත් ඉක්මණින් බිඳ වැටෙන ස්වරූපයෙන් යුක්ත විය. සංගම් මූලික පුවත්පත් එම සංගම්වල අරමුණු හා පරමාර්ථ අනුව ප්‍රකාශයට පත්වූ අතර ඒවායේ ඇතිවූ අභ්‍යන්තර ගැටුම් හේතුවෙන් විවිධ ගැටලුවලට මුහුණ පෑ බව ද හඳුනාගත හැකිය.

ව්‍යාපාරික මූලික පුවත්පත් ආයතනයක් ලෙස යම් මට්ටමක හෝ සාර්ථකත්වයක් ලබා තිබුණේ Times ආයතනය පමණි.

මෙම පසුබිම යටතේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක්හවුස්) බිහිවනුයේ දේශීය ව්‍යාපාරික පුවත්පත් ආයතනයක් වශයෙනි. එහි නිර්මාතෘවරයා එක්සත් ඩී. ආර්. විජේවර්ධනයි.

## 2.2 ඩී. ආර්. විජේවර්ධන හා ලේක්හවුස් ආයතනය

මෙරට පුවත්පත් හිමිකාරිත්වය පිළිබඳ සාධකයේ දී ප්‍රබල පුද්ගලයකු ලෙස ඩී. ආර්. විජේවර්ධන සැලකිය හැකි ය. 20 වන සියවසේ දෙවන දශකයේ අගභාගයේ සිට පස්වෙනි දශකය දක්වා වූ කාල පරිච්ඡේදයේ පුවත්පත් හිමිකරුවකු ලෙස තීරණාත්මක භූමිකාවක් නිරූපණය කළේ ය.

නව පුවත්පතක් ආරම්භ කරනු වෙනුවට පැවති පුවත්පත්වල අයිතිය ලබාගැනීම විජේවර්ධනගේ අරමුණ විය. ඔහු දිනමිණ, Observer, Ceylonese, Ceylon Independent, Morning Leader වැනි පුවත්පත් සියල්ල මිල දී ගන්නා ලදි. එයින් දිනමිණ හා Observer පුවත්පත් ද, Daily News නම් නව පුවත්පතක් ද ආරම්භ කර සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම නමින් පවත්වාගෙන යනු ලැබිණි.

තම පුවත්පත් ආයතනයට තරගකරුවන් ඇතිවීම වළක්වා ගැනීම සඳහා නවතා දමා තිබී මිල දී ගත් Independent හා Morning Leader පුවත්පත්වල මුද්‍රණ යන්ත්‍ර බේරේ වැවේ ගිල්වා දැමූ බව පැවසේ (විජේතුංගඃ 2003, 117). ලේක්හවුස් ආයතනයේ අයිතිය පිළිබඳ පූර්ණ හිමිකම විජේවර්ධන සතු විය. කොටස් හිමියන් සුළු පිරිසක් සිටිය ද ඉන් බහුතරයක් විජේවර්ධන පවුලේ සාමාජිකයන් විය (Hulugalle: 1960, 103).

පුවත්පත්වල අන්තර්ගතය කෙසේ සකස් විය යුතු ද යන කාරණයේ දී නිසි බලධාරියා වූයේ විජේවර්ධන යි. ආරම්භක අවධියේ Daily News පුවත්පතට කතුවරයකු පවා නොසිටි අතර හවස් වරුවේ පැමිණෙන විජේවර්ධනගේ මිතුරන් කතුවැකිය ලියූ බව ඔහුගේ චරිතාපදානයේ සඳහන් වේ. ලයනල් ද ෆොන්සේකා, ඒ. ටී. ද සිල්වා සහ ජේ. ආර්. වීමන් ඉන් කැපී පෙනේ (Hulugalle: 1960, 98).